**ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

**------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් ඉදිරිපත් කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7 (**vi**) ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශවල සඳහන් සංඛ්‍යා පදනම් කරගෙන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කළ යුතුව තිබුණි. භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශ අනුව දෙපාර්තමේන්තුවේ පුනරාවර්ථන වියදම රු.134,549,494 ක් වී තිබුණත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.30,345 ක් අඩුවෙන් රු.134,519,149 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඒසීඒ-එෆ් ආකෘතියේ අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම රු.30,100,634 ක් දෙපාර්තමේන්තු පොත් අනුව නිවැරදිය. වෙනස රු.30,345 ක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගිණුම් සාරාංශ මගින් සෘජුවම හරකර ඇති මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද දුම්රිය බලපත්‍ර වෙනුවෙන් අදාළ වියදමයි. |
| (ආ) | ඉහත (අ) ඡේදයෙහි නිරීක්ෂණය නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සඳහන් අග්‍රිම ගිණුමේ ශේෂය රු.212,902,954 ක් විය යුතුව තිබුණද, එය රු.30,345 ක් වැඩියෙන් රු.212,933,299 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවීම. | |

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව හා ඒසීඒ 6 ආකෘති පත්‍රය අනුව 2018 | මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොමැති | විගණනය සඳහා මෙම තොරතුරු ලබාගත් මූලාශ්‍රය |

| | | |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ වටිනාකම තුළ ඇතුළත් ප්‍රවාහන හා උපකරණවල වටිනාකම රු.32,217,000 ක් වී තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තුවට අයත් මෝටර් වාහනවල වටිනාකම රු.37,300,000 ක් වී තිබුණි. ඒ අනුව රු.5,083,000 ක් වටිනා ප්‍රවාහන හා උපකරණ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | වත්කම් වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවීම. | පිළිබඳව පැහැදිලිතාවයක් නොමැති අතර, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ තොරතුරු නිවැරදිය. |

## 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ---------------------------- |
| (අ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, භාණ්ඩාගාර අග්‍රිම රු.479,106,000 ක් ද, වෙනත් ලැබීම් රු.4,658,795 ක් ද, තැන්පත් ලැබීම් රු.145,570,835 ක් වශයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.629,335,630 ක් විය යුතුව තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ලෙස රු.28,005,213 ක් අඩුවෙන් රු.601,330,417 ක් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති සියලුම වටිනාකම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 267/2018 හා 2018.11.21 දිනැති 2018 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ චක්‍රලේඛයේ උපදෙස් අනුව හා එම චක්‍රලේඛයේ 5 ඡේදයේ සඳහන් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂගෙන් දුරකථන ඇමතුම් මගින් ලැබුණු වාචික උපදෙස් පරිදි දක්වා ඇති බැවින් මේ පිළිබඳව වැඩිදුරටත් |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු.134,544,949 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. එසේ වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වෙනුවෙන් රු.157,652,592 ක් ද, මාරු කිරීම් වෙනුවෙන් රු.247,937,612 ක් ද, තැන්පත් ආපසු ගෙවීම් වෙනුවෙන් රු.217,486,100 ක් වශයෙන් රු.623,076,304 ක් වැය කර තිබුණි. ඒ අනුව රු.488,531,355 ක වෙනසක් පැවතුණි. | - ඉහත පරිදි - | විගණකාධිපති වාර්තාවේ ඇති වෙනස සම්බන්ධයෙන් කරුණු විමසීමේදී රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ වෙතින් විමසන ලෙස මා වෙත උපදෙස් ලබාදෙන ලදී. |
| (ඇ) | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ කිසිදු වටිනාකමක් දක්වා නොතිබුණද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව රු.4,895,338 ක අත්තිකාරම් ආපසු අයකර ගැනීම් ඒ යටතේ දක්වා නොතිබුණි. | - ඉහත පරිදි - | |
| (ඈ) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත් කර ගැනීම් වෙනුවෙන් රු.280,362,796 ක් වැය කර තිබුණි. එසේ වුවද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව භෞතික වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.78,383 ක් ද, අත්තිකාරම් ගෙවීම සඳහා රු.11,076,282 ක් ද වශයෙන් රු.11,154,665ක් පමණක් වැය කර තිබීම නිසා රු.269,208,131 ක වෙනසක් පැවතුණි. | - ඉහත පරිදි - | |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇප ලේඛනය පවත්වා නොතිබුණු අතර වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ඇප ලේඛනය** | | |
| ඇප තැබිය යුතු නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඇප තැබීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් අයදුම් පත් ගෙන්වා ගත් නමුත් එම අයදුම් පත් සමඟ එවන ලද 1999.04.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/99 අදාළ වන්නේ දිස්ත්‍රික් ලේකම්වරුන් හා ආණ්ඩුවේ ඒජන්තවරුන් සඳහාය. |
| **(ආ) වාහන ලොග් පොත්** | | |
| දෙපාර්තමේන්තුවේ වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි. ඒ ඒ වාහන සම්බන්ධයෙන් වාහනය පිළිබඳ විස්තර, දැවෙන ඉන්ධන ප්‍රමාණය, මෝටර් රථ අලුත්වැඩියා කටයුතු සඳහා ගෙවීම් යනාදි තොරතුරු සම්පූර්ණ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645 (අ) ප්‍රකාරව වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. | වාහන ලොග් පොත් සම්බන්ධයෙන් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කරන ලදී. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය - නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 571 (3) | දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වලට අදාළව එකතුව රු.4,842,839 ක් වූ තැන්පතු 10 ක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් මුළුල්ලේ පියවීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ වන විට වර්ෂ දෙක ඉක්මවා ඇති තැන්පත් ගිණුමේ රඳවා ඇති මුදල් අදාළ තැනැත්තන් වෙත ගෙවීම් කිරීම සිදු කරමින් පවතී. |
| **(ii)** මුදල් රෙගුලාසි 104 | දෙපාර්තමේන්තුවේ පාදුක්ක හා නුවරඑළිය වැඩ භාර නිලධාරී කාර්යාලවල සිදු වූ රු.189,358 ක් වටිනා පරිගණක උපාංග නැතිවීම සිදුවී වර්ෂයකට වැඩි කාලයක් ගත වී තිබුණත්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි.<br>අනුරාධපුර වැඩභාර නිලධාරී කාර්යාලයේ 2018 නොවැම්බර් 10 දින සිදු වූ රිය අනතුර සම්බන්ධයෙන් අලාභ හානි නිශ්චය කිරීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. | පාඩු සහ අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම අලාභහානී දෙක සඳහාම නුවර එළිය හා අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ආරම්භ වී ඇති අතර, එම නඩු තීන්දු ලැබෙන තුරු මු.රෙ.104 පරීක්ෂණයේ වගකිව යුත්තන් හඳුනා ගැනීමට නොහැකිව ඇත. මේ සම්බන්ධයෙන් අදාළ පොලිස් ස්ථාන සමඟ නිරතුරුවම සම්බන්ධීකරණය සිදු කරමින් පවතී.<br>අනුරාධපුර රිය අනතුර සම්බන්ධයෙන් මු.රෙ 104 වගන්තිය යටතේ පරීක්ෂණ කටයුතු 2019 මාර්තු මස ආරම්භ කරන ලදී. අදාළ රිය අනතුර සම්බන්ධ මු.රෙ.පරීක්ෂණ විශේෂ විමර්ශණ අවසන්ව ඇති අතර පත් කරන ලද කමිටුව වෙතින් අවසාන වාර්තා කඩනමින් ලබා ගැනීමට නියමිතය. |

(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ
------------

| | | | | |
|---|---|---|---|---|
| | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 3.2.3 සහ 3.2.4 ඡේද | සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා අතිරික්තතා වාර්තා කිරීම හා ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතු වුවත් 2019 අප්‍රේල් 30 වන විටත් එසේ සිදු කොට නොතිබුණි. | 2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම. | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.2 ඡේදයේ පරිදි 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කළ යුතු දිනය වන්නේ 2019 මාර්තු 31 දිනය වේ. එදිනට පෙර භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇතත් රටේ පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් දිස්ත්‍රික් කාර්යාල වලින් එම වාර්තා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පමණක් ප්‍රමාද වී ඇත. නමුත් මේ වන විට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලැබී ඇත. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ<br>------------------ | | | |
| | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදය | ආයතනය සතු සියලු වත්කම් සම්බන්ධ විස්තර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ලබා දිය යුතු වුවද, 2019 මැයි 20 දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද වත්කම් පිළිබඳ විස්තර වාර්තාව 2019/05/21 දින කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සලසා තිබුණු ප්‍රතිපාදන නිෂ්ඵල වීම | | |
| මූලධන වැය විෂයයන් 03 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 3.20 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුවීම. | i. 332-1-1-1303-11 2018 වර්ෂයේ ගොඩනැගිලි හිමිකරු හා දෙපාර්තමේන්තුව විසින් ඇති කර ගන්නා ලද බදු ගිවිසුම අනුව රු.50,000 කට වැඩි නඩත්තු වියදම් ගොඩනැගිලි හිමිකරු විසින්ද ඊට අඩු වියදම් දෙපාර්තමේන්තුව විසින් ද දැරීමටත් ගිවිසුමට එළඹී ඇත. නමුත් 2018 වර්ෂයේදී රු.50,000 ට අඩු වියදම් නොතිබුණු බැවින් ගොඩනැගිලි නඩත්තු වියදම් ඉතිරි වී ඇත.<br><br>332-1-1-1703-11 2018 වර්ෂයේ භාෂා දීමනා ප්‍රතිපත්තිය යටතේ ගෙවීම් කිරීමට වවුචර් ඉදිරිපත් නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.<br><br>ii. භාණ්ඩාගාරය විසින් අක් මුදල් ලබා නොදීම හේතුවෙන් ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් දැරීමට නොහැකි වීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) අධිප්‍රතිපාදන සලසා තිබීම | | |
| පුනරාවර්තන වැය විෂයයන් 09 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 50 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසිය 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුවීම. | i. 2018 දෙසැම්බර් මාසය තුළදී ප්‍රමාණවත් තරම් අක් මුදල් ලබා නොදුන් බැවින් වවුචර් ඉදිරිපත් වී තිබුණද, ගෙවීම් කිරීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.<br><br>ii. කාර්ය මණ්ඩලයේ 231 පුරප්පාඩුව පැවතීම, ලිපි ද්‍රව්‍ය දිස්ත්‍රික් කාර්යාලවලට ලබා දීමේදී අරපිරිමැස්මෙන් නිකුත් කිරීම, |

| | | |
|---|---|---|
| | | බිල්පත් ඉදිරිපත් නොවීම, මාණ්ඩලික නිලධාරී පුරප්පාඩු පැවතීම, බිල්පත් ඉදිරිපත් වුවද 2018 දෙසැම්බර් මාසයේදී අක්මුදල් ප්‍රමාණවත්ව නොලැබීම, ඉතිරියට හේතු ලෙස දක්වා ඇත. |

**2.2 තත්ත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ක් ඇතුළත පියවිය යුතුව තිබුණද, අවස්ථා 07 කදී නිකුත් කර තිබුණු එකතුව රු.112,500 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම මාස 02 සිට මාස 10 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. | මුදල් රෙගුලාසිය 371(5) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අතුරු අග්‍රිම ලබාගත් වහාම නිරවුල් කිරීමට කටයුතු කරන මෙන් සියලු දිස්ත්‍රික් කාර්යාල හා මාණ්ඩලික නිලධාරීන් වෙත මාගේ අංක DNCWS/FD/01/14 හා 2018.12.19 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති අතර මේ වන විට අත්තිකාරම් ලබා ගැනීමේදී අදාළ කාර්යයන් නිමවූ වහාම අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වීම. | 2014.02.17 දිනැති අංක 2014/01 චක්‍රලේඛය අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා නියමිත ආකෘතියක් ලබා දී නොමැති අතර එහි ඇතුළත් විය යුතු කරුණු සඳහන් කර ඇත. එබැවින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා 2015.09.20 දින ගන්නා ලද කැබිනට් තීරණ අනුව ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක MNPEA/PLN/APG/15 හා 2015.10.14 දිනැති ලිපිය මගින් ලබා දුන් උපදෙස් අනුව නියමිත ආකෘති පත්‍රය |

භාවිතා කර 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇති අතර, එහි පිටපතක් ඔබ වෙත ද ලබා දී ඇත. එම ආකෘතිය තුළ 2014/01 චක්‍රලේඛය අනුව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විය යුතු කරුණුද ඇතුළත් වී ඇත.

**3.2 ව්‍යාපෘති නිම නොකර අත් හැරීම**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති දිස්ත්‍රික්ක 18 කට අයත් ප්‍රජා මූල සංවිධාන විසින් ක්‍රියාත්මක කළ ජල ව්‍යාපෘති 222 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | අක්‍රීය ජල ව්‍යාපෘති නැවත සක්‍රීය තත්වයට පත් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙම ව්‍යාපෘති නියාමනය කිරීම සඳහා 2014 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇත. දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ගත් බොහෝ ජල ව්‍යාපෘතිවල නිසි නඩත්තු හා මෙහෙයුම් ක්‍රමවේද අනුගමනය කර නොමැති අතර එම ගැටළු දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමට කටයුතු කර ඇත. ඒ අනුව දෙපාර්තමේන්තුවට වෙන්වී ඇති රු.මිලියන 200 ක සීමාව තුළ මෙන්ම වෙනත් ආයතන වල ප්‍රතිපාදන මතද බොහෝ ජල ව්‍යාපෘතිවල ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කර ඇත. එහිදී අක්‍රීය ජල ව්‍යාපෘතිවල මෙන්ම පවත්නා ජල ව්‍යාපෘති තවදුරටත් අක්‍රිය නොවී පවත්වාගෙන යාම සඳහාද ප්‍රතිපාදන වෙන්කර ඇත. අදාළ සංවර්ධන කටයුතු ද සිදු කර ඇත. මෙම සියලු ව්‍යාපෘතීන් වෙනත් පාර්ශවයක් විසින් ක්‍රියාත්මක කර 2014 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් කර ඇති ව්‍යාපෘති බැවින් එම ගැටලු ක්ෂණිකව නිවැරදි කිරීමේ හැකියාවක් නොමැත. |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණය සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කළ ප්‍රජා මූල සංවිධානය යටතේ ක්‍රියාත්මක වන පිරිවැය රු.57,767,542 ක් වූ ව්‍යාපෘති 33 ක් 2018 මැයි 31 දින වනවිටත් නිම කර නොතිබුණි. | සැලැසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙම ව්‍යාපෘති 33 ම 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කර වැඩ අවසන් කිරීමට නොහැකි වීමෙන් 2019 වර්ෂයට අවිච්ඡේද කර ඇත. එහිදී 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව එක් එක් ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු පිළියෙල කර ක්‍රියාත්මක කළ පසු නිමි වටිනාකම අනුව ඇස්තමේන්තු කළ ඉතිරි වූ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට අනුමත කළ ව්‍යාපෘති වේ. එබැවින් එම ව්‍යාපෘති 2018 වර්ෂයේ අවසන් කිරීමට නොහැකි වූ අතර එම ව්‍යාපෘති 2019 වර්ෂයේ අවසන් කිරීමට කටයුතු යොදා ඇත. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තා 2019 මැයි 31 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස්කර භාෂා 03 ටම පරිවර්තනය කිරීමට කටයුතු කර ඇත. ඉදිරි සති 03 ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ධාවනයට යොදා නොගන්නා වාහන** | | |
| දෙපාර්තමේන්තුව සතු වාහන 04 ක් ධාවනය නොකර දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ ගාල් කර තිබුණු බව 2019 අප්‍රේල් 25 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. | ගර්භිත තත්ත්වයේ වාහන අලුත්වැඩියා කළ නොහැකි නම් වෙන්දේසි කිරීමට පියවර ගත යුතු වීම. | වාහන 04 කින් එක් වාහනයක් අලුත්වැඩියා කර ධාවනයේ යෙදවීමත්, තවත් වාහනයක් මුදල් රෙගුලාසි 104 ප්‍රකාර කටයුතු කර අවසන් වූ පසු තීරණය ගැනීමට කටයුතු කිරීමත්, වාහන දෙකක් කාර්මික නිලධාරීගේ තීරණය ලබා ගැනීමෙන් පසුව හා අනෙක් වාහනය අපහරණය කිරීමේදී ඇති වී තිබුණු ගැටළුව නිරාකරණය කළ පසු අපහරණය සිදු කිරීමටත් කටයුතු සිදු කරනු ලැබේ. |
| **(ආ) වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීම** | | |
| ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අයත් ප්‍රජා ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ වාහන දහතුනක් (13) ඇතුළුව වෙනත් ආයතනවලට අයත් වාහන දහහතක් (17) ක් සමාලෝචිත වර්ෂය තුළ පරිහරණය කර තිබුණි. | මෙම වාහන විධිමත්ව පවරා ගැනීමට හෝ අදාළ ආයතනවලට මුදා හැරීමට කටයුතු කළ යුතු වේ. | වාහන 12 ක් ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියට අයත්ව පැවති අතර, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව එම වාහන දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. එම වාහන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.<br><br>නිවාස ඉදිකිරීම් හා මහජන උපයෝගීතා අමාත්‍යාංශය නමින් වාහන 03 ක් ඇති අතර එම වාහන එවකට ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය විසින් අමාත්‍යාංශය වෙත භාරදී තිබූයෙන් එම ව්‍යාපෘතියේ අනුප්‍රාප්තිය ආයතනය ලෙස දෙපාර්තමේන්තුව වෙත මෙම වාහන නැවත භාර දී ඇති අතර එම වාහන ද පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | | ලුනාව ව්‍යාපෘතියට හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් වාහන 02 දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු දැනටමත් සිදු කරනු ලැබේ. |

(ඇ) **නිෂ්ක්‍රීය බැංකු ගිණුම්**

**----------------------**

| | | |
|---|---|---|
| 2014 සැප්තැම්බර් 22 දිනැති අංක 1881/6 දරන හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයක් මඟින් ජාතික ප්‍රජා ජලභාරයේ කාර්යභාරය ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි. ජාතික ප්‍රජා ජලභාරයේ 2014 දෙසැම්බර් 31 දිනට වූ ගිණුම් වාර්තා අනුව රු.1,794,454 ක් වන ස්ථාවර තැන්පත් ගිණුමක් හා රු.682,554 ක් වන බැංකු ජංගම ගිණුමක් පවත්වා තිබුණි. එදින සිට 2019 මැයි 31 දින දක්වා දෙපාර්තමේන්තුව වෙත එම ගිණුම් පවරා ගැනීමක් හෝ රජයේ ආදායමට බැර කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. තවද විගණනය විසින් රැස්කරගත් තොරතුරු අනුව 2018 දෙසැම්බර් 31 දිනට අදාළ ස්ථාවර තැන්පත් ගිණුමේ හා ජංගම ගිණුමේ ශේෂය පිළිවෙලින් රු.2,441,575 ක් හා රු.837,323 ක් වී තිබුණි. | මෙම ගිණුම්වල ශේෂයන් කඩිනමින් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වීම. | ජාතික ප්‍රජා ජල භාරය නමින් පවතින ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය පවරා ගැනීම සම්බන්ධයෙන් නගර සැලසුම් ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇති අතර ඉදිරියේදී උපදෙස් ලැබුණු පසු ඒ අනුව කටයුතු කරමි. |

**3.6 රජයේ නිලධාරීන්ට ඇප තැබීම**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **---------------------** | **-----------** | **----------------------------** |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී | මුදල් රෙගුලාසි | ඇප තැබීම සඳහා රාජ්‍ය ගිණුම් |

| | | |
|---|---|---|
| ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (1)(ග) ප්‍රකාරව ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තැබිය යුතු වුවද, දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් එසේ ඇප තබා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනයද යාවත්කාලීන කර නොතිබුණි. | ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුව වෙතින් අයදුම් පත් ගෙන්වා ගත් නමුත් එම අයදුම් පත් සමඟ එවන ලද 1999.04.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/99 අදාළ වන්නේ දිස්ත්‍රික් ලේකම්වරුන් හා ආණ්ඩුවේ ඒජන්තවරුන් සඳහාය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ තිරසාර සංවර්ධන අරමුණු ලෙස, "සැමට ජලය තිරසාර කළමනාකරණය හා සනීපාරක්ෂාව ලැබීම තහවුරු කිරීම" හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධව දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ මඟපෙන්වීම් හා වැඩමුළු කිසිවක් ආයතනය විසින් පවත්වා නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු සිදු කළ යුතු වීම. | තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ අභ්‍යන්තර වැඩමුළු පැවැත්වීම, චක්‍රලේඛ නිකුත් කිරීම සිදු කර නොතිබුණද, නගර සැලසුම් ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන්ද සහභාගී වී ඇති අතර තිරසාර සංවර්ධනය පිළිබඳ මුදල් අමාත්‍යාංශය නිකුත් කර ඇති චක්‍රලේඛ පිළිබඳව සියලුම අංශ දැනුවත් කිරීමද සිදු කර ඇත. |